# ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය

# කොළඹ

## මාධ්‍ය නිවේදනයයි

2016 ඔක්තෝබර් 11

### කාන්තාවන් සහ ගැහැනු දරුවන් පිළිබඳ ඕස්ට්‍රේලියානු තානාපතිවරිය පළාත් පාලන ආයතන නියෝජනය කරන කාන්තාවන්ට සහාය දක්වීමේ නව වැඩසටහන එළිදක්වයි

කාන්තාවන් සහ ගැහැනු දරුවන් පිළිබඳ ඕස්ට්‍රේලියානු තානාපතිවරිය වන නටාෂා ස්ටොට් ඩෙස්පෝයා මහත්මිය විසින් පළාත් පාලන ආයතනවල කාන්තා නියෝජනය සඳහා වූ නව කෝටා ක්‍රමය සඳහා ඕස්ට්‍රේලියානු ආධාර යටතේ ක්‍රියාත්මක වන සහයෝගය දැක්වීමේ වැඩසටහන අද එළිදැක්වූවාය.

"නායකත්වයේ නියැලි කාන්තාවන් සඳහා සහයෝගය දැක්වීම ඕස්ට්‍රේලියාවේ විදේශ ප්‍රතිපත්තියේ සහ විදේශාධාර වැඩසටහනේ ප්‍රමුඛතාවක්" යැයි ශ්‍රී ලංකාවේ සිදු කරන සිය පළමු නිල සංචාරය අතරතුර දී තනාපතිනී ස්ටොට් ඩෙස්පෝයා මහත්මිය කියා සිටියාය.

"බොහෝවිට පිරිමින්ට වඩා වෙනස් වන සිය ජීවන අත්දැකීම් තුළින්, කාන්තාවන් සුවිශේෂ දෘෂ්ටිකෝණ, ප්‍රමුඛතා සහ ශක්තීන් ගෙන එයි. කාන්තාවන්ගේ ප්‍රතිපත්ති ප්‍රමුඛතාවලට වඩා හොඳින් ප්‍රතිචාර දැක්වීම කාන්තා නායිකාවන් වෙතින් වැඩි වශයෙන් අපේක්ෂා කිරීමට පුළුවන."

හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වන තානාපතිනි ස්ටොට් ඩෙස්පෝයා මහත්මිය, රෝසි සේනානායක මහත්මිය සහ වෛද්‍ය සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය සමග දිවා භෝජනයකට ද සහභාගී වූවාය. ශ්‍රී ලංකාවේ සෑම මට්ටමකම පාහේ දක්නට ලැබෙන අඩු කාන්තා නියෝජනය සම්බන්ධ ගැටලුව නිරාකරණය කර ගැනීම සඳහා අලුතින් හඳුන්වා දී ඇති කෝටා ක්‍රමය මනා අවස්ථාවක් වනු ඇති බව මෙහි දී සියලු දෙනා පෙන්වා දුන්හ.

ඉදිරි මාස 12ක පමණ කාලය තුළ දී මැතිවරණ කොමිසමේ , පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ, කාන්තා සහ ළමා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයේ සහයෝගය ඇතිව මෙම වැඩසටහන යටතේ ඡන්දයෙන් තේරී පත්වන මහජන නියෝජිතයන් අතරට කාන්තාවන් අයත් වීමේ වැදගත්කම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ ඉලක්ක වැඩසටහනක් ක්‍රියාත්මක වනු ඇත.

මෙම වැඩසටහන යටතේ පළාත් පාලන මැතිවරණයෙන් පසුව අලුතින් තේරී පත් වන කාන්තා මහජන නියෝජිතවරියන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ දේශපාලන මණ්ඩලයේ වැඩසටහන් සඳහා සහාය දැක්වීම මෙන්ම කාන්තා අපේක්ෂිකාවන් වෙත මතුවන බාධක ඉවත් කිරීම සඳහා දේශපාලන පක්ෂ සමග සහයෝගයෙන් කටයුතු කිරීම සිදු කෙරේ.

“දේශපාලන පක්ෂ තුළ කෝටා ක්‍රමය පිළිබඳ අවබෝධයක් ඇති කිරීම සහ කාන්තා අපේක්ෂාවන් වෙනුවෙන් හඬක් නැගීමේ ජාලයක් පිරිමි දේශපාලන නායකයන් අතර ගොඩනැගීම මෙම වැඩසටහනේ ප්‍රධාන කරුණු අතර වන බව,” ශ්‍රී ලංකාවේ ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් බ්‍රයිස් හචිසන් මහතා කියා සිටියේය. “මෙම වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යෑම සඳහා පිරිමින්ගෙන්, විශේෂයෙන් බලය හසුරුවන සහ බලපෑම් සහගත ස්ථානයන්හි සිටින අය ගෙන්, ලැබෙන උපකාරය බෙහෙවින් වැදගත් වනවා” යැයි ද හෙතෙම කියා සිටියේය.